MR-4

# පවුල් පරිසරය ආශ්‍රිත සාධක ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් සිසුන්ගේ අධ්‍යාපන සාධනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

රමණී රේණුකා රණතුංග

B. Com. (Sp.)
Dip. in Eng.
PGDE
PGD in Counseling
M. Ed.

ලියාපදිංචි අංකය: 2004 M.Phil. 16

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධියෙහි අවශ්‍යතා සපුරාලීම සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2013

UCLIB
567850

# සංක්ෂිප්තය

නූතන සමාජ වෙනස්කම් අනුව වෙනස් වූ පවුල් පරිසරය හා සාධනය අතර පවත්නා සම්බන්ධතාව පරීක්ෂා කිරීම අධ්‍යයන අභිමතාර්ථය විය. සිසුන්ගේ පවුල් පරිසරය ආශ්‍රිත සාධක විමසා බැලීම, අධ්‍යාපන සාධනය පරීක්ෂා කිරීම, පවුල් පරිසරය හා සාධනය අතර පවත්නා සම්බන්ධතාව විමසා බැලීම සහ පවුල, පරිසරය හා සාධනය අතර සම්බන්ධතාවෙන් මතු වන ගැටලු විමසීම පර්යේෂණ අරමුණු විය. පරායත්ත විචල්‍ය වූ සාධනය කෙරෙහි පවුල් පරිසරය ආශ්‍රිත ස්වායත්ත විචල්‍ය දහතුනක (පවුලේ රැකියා පසුබිම, පවුලේ ආර්ථික පසුබිම, පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම, නිවසේ භෞතික තත්ත්වය, නිවසේ අධ්‍යාපන සම්පත්, දරුවන්ගේ අධ්‍යාපන පිළිබඳ දෙමාපිය පෙළඹවීම, පවුලේ සංස්කෘතික ප්‍රග්ධනය, පවුලේ සමාජ ප්‍රග්ධනය, පවුලේ සාමාජික සංඛ්‍යාව, දෙමාපියන් ජීවතුන් අතර සිටීම/නො සිටීම, ද්විමාපියභාවය සහ තනි මාපිය භාවය අනුව පවුලේ ස්වභාවය, සිසුන් පදිංචි ව සිටින ස්ථානය සහ සිසුන්ගේ අනාගත රැකියා අපේක්ෂණ) බලපෑම විමසන ලදී.

සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදී. දිස්ත්‍රික්ක තුනක පාසල් නවයක 11 වන ශ්‍රේණියේ අහඹු ව තෝරා ගත් සිසුන් 450ක් ශිෂ්‍ය නියැදිය විය. ශිෂ්‍ය නියැදියෙන් ප්‍රශ්නාවලියකින් දත්ත රැස් කරන ලදී. සිසුන් 45 දෙනෙකු ද, ඔවුන්ගේ ගුරුවරුන්ගෙන් 45 දෙනකු සහ දෙමාපියන්ගෙන් 45 දෙනකු සමග ද ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුලයකට අනුව සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. බස්නාහිර හා දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් පැවැත්වූ 2010 වර්ෂයේ, අවසාන වාර පරීක්ෂණයේ සිංහල භාෂාව, ගණිතය, ඉතිහාසය සහ විද්‍යාව යන විෂයවලට අදාළ සාධන පරීක්ෂණ ලකුණු ද දත්ත ලෙස රැස් කර $x^2$ පරීක්ෂාව, ලකුණු විසුරුම් ව්‍යාප්ති, සංඛ්‍යාත බහුඅස්‍ර, මධ්‍යන්‍යය, විසැලි විශ්ලේෂණය හා ප්‍රතිශත මගින් විශ්ලේෂණය කරන ලදී. ප්‍රමාණාත්මක දත්තවලින් මතු වූ රටා පැහැදිලි කිරීමට සම්මුඛ සාකච්ඡාවල ගුණාත්මක දත්ත, සාරාංශ කරුණු ලෙස භාවිත කරන ලදී.

පර්යේෂණ අනාවරණ අනුව, පවුල් පරිසරයට අදාළ ව පරීක්ෂා කළ විචල්‍ය 13 අනුව 11 වන ශ්‍රේණියේ සිසුහු විවිධ පවුල් පරිසර නියෝජනය කරති. පවුලේ රැකියා පසුබිම, පවුලේ ආර්ථික පසුබිම, පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපන පසුබිම, නිවසේ භෞතික වාතාවරණය, නිවසේ අධ්‍යාපන සම්පත්, දරුවන්ගේ අධ්‍යාපන සඳහා දෙමාපිය පෙළඹවීම, පවුලේ සංස්කෘතික ප්‍රග්ධනය, පවුලේ සමාජ ප්‍රග්ධනය, පවුලේ සාමාජික සංඛ්‍යාව, සිසුන් පදිංචි ව සිටින ස්ථානය, සිසුන්ගේ අනාගත රැකියා අපේක්ෂණ සහ අධ්‍යාපන සාධනය අතර සියයට එකක වෙසෙසියා මට්ටමකින් යුතු ව සම්බන්ධයක් පවතින බව $x^2$ පරීක්ෂාව මගින් අනාවරණය විය. දෙමාපියන් ජීවතුන් අතර සිටීම/නොසිටීම සහ ද්විමාපියභාවය හෝ තනිමාපියභාවය අනුව පවුලේ ස්වභාවය යන විචල්‍ය දෙක සහ ශිෂ්‍ය සාධනය අතර

සම්බන්ධතාවක් නොමැති බව (හම්බන්තොට, මාතර) $x^2$ පරීක්ෂාවෙන් හෙළි විය. එහෙත් කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් තනි මාපිය පවුල හා අධ්‍යාපන සාධනය අතර සම්බන්ධතාවක් පවතින බව $x^2$ පරීක්ෂාවෙන් අනාවරණය වුව ද ප්‍රතිශත විශ්ලේෂණයෙන් දිස්ත්‍රික්ක තුනෙහි ම එහි සබඳතාවක් පවතින බව තහවුරු විය.

හොඳ ම සාධනය සිංහල භාෂාව විෂයයටත්, දෙවන ස්ථානය ඉතිහාසය විෂයයටත්, තෙවන ස්ථානය විද්‍යාව විෂයයටත් ලැබිණි. ගණිතය විෂයය සඳහා අවම සාධනය පෙන්නුම් කෙරිණි. සාධනය පිළිබඳ විවිධ ගැටලු ද සිසුන්ට උද්ගත ව තිබිණි. හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්කවල සිසුන්ට සිංහල භාෂාව පහසු විෂයයක් වන විට, කොළඹ දිස්ත්‍රික්කයේ සිසුන්ට ඉංග්‍රීසි භාෂාව පහසු විෂයයක් වී ඇත. හම්බන්තොට සහ මාතර සිසුන්ට ඉංග්‍රීසි භාෂාව දුෂ්කර වන විට කොළඹ සිසුන්ට ඉතිහාසය දුෂ්කර විෂයය වී තිබිණි. දිස්ත්‍රික්ක තුනේ ම සිසුන්ට ගණිතය හා විද්‍යාව දුෂ්කර විෂය විය. විෂය දුෂ්කර වීම හා සාධනය අඩු වීම කෙරේ පාසල හා සිසුන් සම්බන්ධ හේතු බලපා ඇත. නියැදියේ සිසුන් සියයට 91.77ක් අමතර පන්ති යාමට කැමැත්තෙන් පසු වූහ. නියැදියේ සිසුන්ගෙන් සියයට 12කට අධ්‍යාපනය සඳහා නිවසෙන් සහයෝගය නො ලැබිණි.

පර්යේෂණයෙන් යෝජනා කරනුයේ ගුණාත්මක පාසල් සංවර්ධනයකට ඵලදායී අභ්‍යන්තර අධීක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, සාධනය අඩු සිසුන්ට විශේෂ ක්‍රමවේද අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පවුලේ අහිතකර ලක්ෂණ නිසා බලපෑම් ලද සිසුන්ගේ ගැටලු හඳුනා ගැනීම සහ ඒවා නිරාකරණය කිරීමට පාසලින් උදව් ලබා දීම, මනා සුදුසුකම් ලත් ගුරුවරුන් මගින් ශිෂ්‍ය උපදේශනය ක්‍රියාත්මක කිරීම, සිසු ප්‍රගතිය හා දුබලතා පිළිබඳ ගුරුදෙගුරුන් හමු වී නිරන්තර ව සාකච්ඡා කිරීම, ධන උපස්ථම්භනවලින් සිසුන් දිරි ගැන්වීම, විවිධ සමිති සංවිධාන, ප්‍රජාව, සුභපතන්නන් සහභාගි කරවා ගෙන සිසු අවශ්‍යතා ඉටු කර දීම, සිසුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා පූර්ණ ලෙස ඉටු කිරීමෙහි ලා ගුරුවරයා ඇපකැප වී වැඩ කිරීම, ළමා මිතුරු පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම, දිළිඳු ජන කොටස්වලට මූල්‍ය සහ ද්‍රව්‍ය ආධාර සැපයීම, සම්පත් ඌන පාසල්වලට සම්පත් ලබා දීම, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය සාධනය නැංවීමේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඒ ඒ දිස්ත්‍රික්කයට සුවිශේෂී ගැටලු සඳහා ප්‍රතිකාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වේ.

තනි මාපිය පවුල්වල ළමයින්ගේ සාධනය නඟා සිටුවීමට එම පවුල්වලට ආර්ථික සහනාධාර ලබා දී මානසික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. තනි මව්/පිය ගැටලු සහ එම පවුල්වල දරුවන්ගේ සාධනය ඇතුළු අනෙකුත් ගැටලු විසඳා ගැනීමට සහායක් ලැබීම සඳහා උපදේශනයට යොමු කළ යුතු ය.

# A study on the impact of factors related to family background on the educational achievement of the secondary school children in Sri Lanka


## Abstract

Aim of the research was to examine the relationship between the family environment that have changed due to recent social changes and the achievement. Specific objectives of the research were to review the family related factors of students and nature of their achievement, to examine the relationship between the family environment and the achievement and to identify issues emerged from the nature of relationship. The impact of 13 independent variables (Family vocational background, Economic background, Educational levels of family members, Physical environment - Educational resources of the home, Parental motivation on the education of their children, Cultural - social capital of the family, Number of members of the family, Living of parents, Nature of the family, Location of the student, Future job expectations of children) on the dependent variable of Achievement was examined.

Survey research method was used. A sample of Grade 11 students (n=450) was randomly selected from 9 schools in 3 districts and data from them were collected from a questionnaire. Interviews were conducted with a sub sample of students (n=45), teachers (n=45), and parents (n=45). Test marks of Sinhala Language, Mathematics, History, and Science were collected from term end tests conducted by Western and Southern Provinces in 2010. Quantitative test marks and responses to questionnaire were analyzed using Chi Squire Test, Distribution Curves, Frequency Polygun Means, Analysis of Variance and Percentages. Qualitative data were used as descriptors to explain the findings of quantitative data.

According to the findings students of the sample represents different family backgrounds. According to the Chi Squire Test, independent variables of Family vocational background, Economic background, Educational levels of family members, Physical environment - Educational resources of the home, Parental motivation on the

education of their children, Cultural - social capital of the family, Number of members of the family, Location of the student, Future job expectations of children had significant relationship with the dependent variable of Achievement at $\alpha$ .01 level. Living of parents and Nature of the family did not have a relationship. According to the percentages, however, Single parent family under the variable of the Nature of family had relationship with the Achievement.

The best achievement was in Sinhala Language and least was in Mathematics. History and Science subjects were between these subjects. Sinhala Language was the easiest subject for students in Hambantota and Matara and English for the students in the Colombo district. English Language was the most difficult subject for students in Hambantota and Matara and History for the students in the Colombo district. Mathematics and Science were difficult for students in both districts. School and student related reasons have affected the low achievement and subject difficulty. 91.77% of students was willing to attend the tuition classes and they believed that it as the best place for the preparation for the examinations. 12% of students did not received support from the family for education.

The research suggests student counseling from expert teachers in every school, implementing an effective internal supervision mechanism, initiating specific remedial programmes for low achievers, providing monitory and items to low income families, continuous dialog between parents and teachers on the strengths and weaknesses of children, motivating students with positive reinforcement, providing resources to low income schools, implementing district wise specific intervention projects for districts as remedial measures, providing students needs with the support of the community and creating a child friendly school environment in schools

Specific mental remedial programmes and economic support are necessary for single parent families.